කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2024

2026 - මැයි

**BCOM E 2025 - සංවිධාන චර්යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි) 06

ප්‍රශ්න පහකට (05) කට පිළිතුරු සපයන්න. කාලය : පැය 03 යි

---

**ප්‍රශ්න අංක 01**

අ) "සංවිධාන චර්යාව" යන පදය නිර්වචනය කර නූතන සංවිධානවල එය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) සමාගමක් දුර්වල සන්නිවේදනය, සේවක ගැටුම්, අඩු අභිප්‍රේරණය සහ අකාර්යක්ෂම නායකත්වය වැනි ගැටළු වලට මුහුණ දෙයි. පසුගිය වසර තුළ සේවක පිරිවැටුම වේගයෙන් ඉහළ ගොස් ඇත.

i) ඉහත සිදුවීමට අදාළ අනෙකුත් සංවිධාන චර්යා ගැටළු 03 ක් හඳුනාගෙන ඉහත සිදුවීමට අදාලත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii.) සේවක කාර්ය සාධනය සහ සේවක රඳවා ගැනීමේ අනුපාතය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු අභිප්‍රේරණ උපාය මාර්ග නිර්දේශ කරන්න

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) සේවක ආකල්ප පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) ආකල්පවල ප්‍රධාන සංරචක විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ) ප්‍රායෝගික උදාහරණ භාවිතා කරමින් සේවා ස්ථානයේ සේවක හැසිරීමට සංජානනය බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) පෞරුෂය නිර්වචනය කර සංවිධාන සැකසුම් (Organizational Settings) තුළ එහි වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) අභිප්‍රේරණය පිළිබඳ ඕනෑම න්‍යායන් දෙකක් සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ) කළමනාකරුවන්ට සංවිධානවල සේවක අභිප්‍රේරණය වැඩිදියුණු කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) සංවිධානයක සන්නිවේදනය නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ආ) ඵලදායී සන්නිවේදනයට ඇති බාධක පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) සංවිධානාත්මක සාර්ථකත්වය සඳහා ඵලදායී සන්නිවේදනයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

අ) නායකත්වය නිර්වචනය කර නායකත්වය සහ කළමනාකරණය අතර වෙනස හඳුනා ගන්න.

(ලකුණු 06)

ආ) ඕනෑම නායකත්ව න්‍යායන් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) ඵලදායී නායකයෙකුගේ ගුණාංග සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

පහත සඳහන් ප්‍රශ්නවලින් හතරක් (04) තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

අ) කණ්ඩායමක් සහ සමූහයක් (Group and Team) අතර වෙනස දක්වන්න.

ආ) සංවිධානවල දක්නට ලැබෙන විවිධ ආකාරයේ ගැටුම් පැහැදිලි කරන්න.

ඇ) සංවිධානවල බලය, දේශපාලනය සහ බලගැන්වීම විස්තර කරන්න.

ඈ) සංවිධානවල ඵලදායී තීරණ ගැනීමේ ක්‍රියාවලිය සාකච්ඡා කරන්න.

ඉ) නූතන සංවිධාන චර්යාව තුල සංවිධාන සංස්කෘතිය සහ සංවිධානාත්මක වෙනස (Organizational Change) පැහැදිලි කරන්න.

(ලකුණු 05X 04)

**(මුළු ලකුණු 20)**